සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

32 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018
## Second Term Test - Grade 12 - 2018

විභාග අංකය ..............................  ව්‍යාපාර අධ්‍යයනය I  කාලය පැය දෙකයි

උපදෙස්
- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. ව්‍යාපාර අධ්‍යයන විෂයේ හර සංකල්ප කීපයක අර්ථය පහතින් දක්වේ.

A කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳව පාරිභෝගිකයා විසින් කරනු ලබන සමස්ත අගයකිරීම.

B අන්තර්ජාලය හරහා නිෂ්පාදිත මිලදී ගැනීම, විකිණීම හා මුදල් ගෙවීම් කිරීම.

C දෙපාර්ශ්වයක් අතර නිෂ්පාදිතයක් හුවමාරු වීම.

D ස්ථාන කීපයක නිෂ්පාදනය කරන දෑ එකට එකතු කිරීමෙන් අවසාන භාණ්ඩය නිපදවීම.

E නිෂ්පාදන ක්‍රියාවලිය අදියර කිහිපයකට බෙදා විවිධ ශ්‍රම කණ්ඩායම්වලට පැවරීම.

මෙම ප්‍රකාශ නිවැරදිව ගැලපූවිට නිවැරදි පිළිතුර වන්නේ,
1. ශ්‍රම විභජනය, පෙරළුම් ක්‍රමය, වෙළඳාම, විද්‍යුත් වාණිජ්‍යය
2. වටිනාකම, විද්‍යුත් වාණිජ්‍යය, වෙළඳාම, ගැලපුම් ක්‍රමය, ශ්‍රම විභජනය
3. විද්‍යුත් වාණිජ්‍යය, ගැලපුම් ක්‍රමය, ශ්‍රම විභජනය, වටිනාකම, වෙළඳාම
4. විශේෂීකරණය, ගැලපුම් ක්‍රමය, වාණිජ්‍යය, ජංගම වෙළඳාම, වටිනාකම
5. ශ්‍රම විභජනය, ගැළපුම් ක්‍රමය, වෙළඳාම, වටිනාකම, පිරිවැය. (.....)

02. අවශ්‍යතා හා වුවමනා අතර පවත්නා සම්බන්ධතාව මැනවින් ප්‍රකාශවන වගන්තිය වන්නේ,
1. අවශ්‍යතා ඉටුකරගැනීම හා වුවමනා සපුරා ගැනීම අතර වෙනසක් නොමැත.
2. වුවමනා සපුරා ගැනීමේදී අවශ්‍යතාද ඉටුවේ.
3. අවශ්‍යතා ඉටුවේනම් වුවමනා සපුරා ගැනීම අවශ්‍ය නොවේ.
4. අවශ්‍යතා අනිවාර්යයෙන් ඉටුකරගතයුතු වුවත් වුවමාන එසේ නොවේ.
5. ප්‍රථමයෙන් අවශ්‍යතා ඉටුකරගත යුතුවන අතර, දෙවනුව වුවමනා සපුරාගත යුතුය. (.....)

03. පහත වගුවේ දක්වෙන්නේ ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් කිහිපයක් සහ ව්‍යාපාර වර්ග කිහිපයකි.

| **ව්‍යාපාර වර්ග කිරීමේ පදනම** | **ව්‍යාපාර වර්ග** |
|---|---|
| 1. නිෂ්පාදනයේ ස්වභාවය/මට්ටම | A කෘෂි/කාර්මික/සේවා |
| 2. නිෂ්පාදනයේ අංශ/මූලය | B සුළු/මධ්‍ය/මහා |
| 3. හිමිකාරත්වය/අයිතිය | C ප්‍රාථමික/ද්විතියික/තෘතියික |
| 4. අරමුණු | D ලාභලැබීම/සමාජ සුභසාධනය |
| 5. පරිමාණය | E පෞද්ගලික/පොදු |

ව්‍යාපාර වර්ග, පදනම්වලට අනුකූලව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. 1 A, 2B, 3 C, 4D, 5E  2. 1A, 2C, 3E, 4D, 5B  3. 1C, 2A, 3D, 4E, 5B
4. 1C, 2A, 3E, 4D, 5B  5. 1B, 2A, 3E, 4C, 5D (.....)

04. විශේෂීකරණ සංකල්පය ආරම්භ වූයේ,
1. භාණ්ඩ හුවමාරුව තුළිනි.  2. මුදල් භාවිතය තුළිනි.
3. වක්‍ර නිෂ්පාදනය තුළිනි.  4. කාර්මික විප්ලවය තුළිනි.
5. ඍජු නිෂ්පාදනය තුළිනි. (.....)

05. ව්‍යාපාර පරිසර බලවේග කීපයක් පහත දැක්වේ. ඒවායින් අභ්‍යන්තර පරිසර බලවේග වලට අයත් කාණ්ඩය තෝරන්න.
අ) සේවකයන්  ආ) ප්‍රජාව  ඇ) සැපයුම්කරු
ඈ) සම්පත්  ඉ) විභව ආයෝජකයන්  ඊ) කළමණාකරුවන්
1. අ, ආ, ඉ  2. අ, ආ, ඇ  3. අ, ඈ, ඊ
4. අ, ඈ, ඊ  5. අ, ඉ, ඊ (.....)

06. ශ්‍රී ලංකාවේ පෙර පැවති ප්‍රාදේශීය සභා මැතිවරණවලදී තෝරාගත් සභිකයින් සංඛ්‍යාව මෙන් දෙගුණයකටත් වඩා සභිකයින් සංඛ්‍යාවක් 2018 ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් තෝරා ගැනීමට තීරණය වී ඇත. මෙම ප්‍රකාශයට අදාළ පරිසර සාධක ය නම්,
1. ප්‍රජාපරිසරය  2. ආර්ථික පරිසරය  3. දේශපාලන පරිසරය
4. තාක්ෂණ පරිසරය  5. ස්වභාවික පරිසරය (.....)

07. පහත ප්‍රකාශ අතුරින් සාර්ව පරිසරයට අදාළනොවන ප්‍රකාශය තෝරන්න.
1. වර්තමාන ශ්‍රී ලංකාවේ ජන ව්‍යුහයේ වැඩිහිටි ජනගහන වර්ධනයක් පෙන්නුම් කරයි.
2. ඇගළුම් ව්‍යාපාරිකයන් තම සේවකයන් සඳහා උත්සව සමයේ දෙන දීමනාව වැඩිකරයි.
3. පොල්තෙල් මිල ඉහළයාම නිසා එළවළුතෙල් ආනයනය සඳහා කටයුතු කර ඇත.
4. පොලිතින් භාවිතය නවතාලීමට රජයේ දැඩි නීති රීති.
5. දකුණු කොරියාව න්‍යෂ්ඨි අවි අත්හදාබැලීමක්. (.....)

08. එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) විසින් ව්‍යාපාරවල සමාජ වගකීම ලෙස ප්‍රමුඛත්වය ලබාදී ඇති ක්ෂේත්‍ර හතර වන්නේ,
1. පරිසරය, මානව අයිතීන්, පාරිභෝගික අයිතීන්, සේවක අයිතීන්
2. මානව අයිතීන්, ආයෝජන අයිතීන්, සේවක අයිතීන්, ප්‍රජා සේවය.
3. මානව අයිතීන්, සේවක අයිතීන්, පරිසර ආරක්ෂාව, ප්‍රජා සේවය
4. ප්‍රජා සේවය, පරිසර අයිතිය, පාරිභෝගික අයිතිය, ආයෝජන අයිතීන්
5. ආයෝජන අයිතීන්, මානව අයිතීන්, සේවක අයිතීන්, පාරිභෝගික අයිතීන්. (.....)

09. A සමාජ සංස්කෘතිය  B ව්‍යාපාරය  C ප්‍රායෝගික බව
D නිවරදි බව  E විශ්වාසනීය බව  F ගනුදෙනුකරු
ඉහත සාධක අතුරින් ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් වියයුතු සාධක ඇතුළත්වරණය වනුයේ,
1. A, B, E හා D  2. A, C, D හා F  3. A, B, C හා F
4. B, C, D හා E  5. B, D, E හා F (.....)

10. සමස්ත සමාජයේ සහ සමීප ප්‍රජාවගේ සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වලත් ජීවන තත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායකවන බවට හා සදාචාරාත්මකව හැසිරෙන බවට අඛණ්ඩව හා අවංකව කැපවීම ව්‍යාපාර සමාජ වගකීමයි. මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,
    1. මාලන් බේකර්
    2. මිල්ටන් ෆ්‍රීඩ්මන්
    3. පිලිපීනය
    4. ඇමරිකා එක්සත් ජනපදය
    5. තිරසාර සංවර්ධනය පිළිබඳ ලෝක ව්‍යාපාර සභාව (.....)

11. පලාත් පාලන ආයතන මගින් අයකරනු ලබන බදු වර්ගයක් වන්නේ,
    1. පුද්ගල ආදායම් බදු
    2. සමාගම් බදු
    3. වරිපනම් බදු
    4. එකතුකළ අගය මත බදු
    5. නිෂ්පාදන බදු (.....)

12. රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ,
    1. රජයේ ආදායම් - වියදම් පිළිබඳ කටයුතුවෙහි ඇතුළත් වේ.
    2. රාජ්‍ය ආදායම බදු හා බදු නොවන ආදායම් වලින් සමන්විත වේ.
    3. සාර්ව ආර්ථික ස්ථායිතාව ආරක්ෂාකර ගැනීම මෙහි අරමුණයි.
    4. රටේ මුදල් සැපයුම පාලනය කිරීමට අදාළ ප්‍රතිපත්ති මෙයට ඇතුළත් වේ.
    5. වර්ථන හා ප්‍රාග්ධන වියදම් වලින් රාජ්‍ය වියදම් සමන්විත වේ. (.....)

13. HACCP ප්‍රමිතිය,
    1. ගිණුම්කරණ පිළිබඳ ප්‍රමිතියකි.
    2. ආහාර සුරක්ෂිතතාව හා කළමනාකරණය පිළිබඳ ප්‍රමිතියකි.
    3. විද්‍යුත් උපකරණ වල ආරක්ෂාව පිළිබඳ ප්‍රමිතියකි.
    4. පරිසර කළමණාකරණය පිළිබඳ ප්‍රමිතියකි.
    5. පරිගණක තාක්ෂණය පිළිබඳ ප්‍රමිතියකි. (.....)

14. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වර්ථමානයේ ක්‍රියාත්මක වනු ලබන්නේ කුමන පනතට අනුවද?
    1. 1964 අංක 38 ලංකා ප්‍රමිත කාර්යාංශ පනත
    2. 2004 අංක 16 දරණ ප්‍රමිත ආයතන පනත.
    3. 1995 අංක 06 දරණ ප්‍රමිත ආයතන පනත.
    4. 1975 අංක 20 දරණ ප්‍රමිත කාර්යාංශ පනත
    5. 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිත ආයතන පනත. (.....)

15. ප්‍රමාණාත්මක ණය සීමා පැනවීමක් නොවන්නේ,
    1. ණය සඳහා උපරිම පරිණත කාල නියම කිරීම.
    2. ණය ලබාදිය යුතු ක්ෂේත්‍ර නිර්දේශ කිරීම.
    3. නව ණය සඳහා උපරිම සීමා පැනවීම.
    4. වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම.
    5. ණයවර ලිපි නිකුත්කිරීමේදී තැන්පත් කළයුතු අවම මුදල් ප්‍රමාණය තීරණය කිරීම. (.....)

16. 1890 හවුල් ආඥාපණතේ 24 වන වගන්තියේ ඇතුළත් නොවන වගන්තිය තෝරන්න.
    1. යෙදූ ප්‍රාග්ධනය වෙනුවෙන් පොලී ලැබීමට හිමිකමක් නැත.
    2. හවුල්කරුවන් කළමණාකරණ කටයුතුවලට සහභාගී වීම හා සියලු හවුල්කරුවන්ට ඒ වෙනුවෙන් පාරිශ්‍රමිකයක් ලැබිය හැකිවීම.
    3. ප්‍රාග්ධනයට සමානව දායක වියයුතු අතර ලාභලාභ සම සමව බෙදාගත යුතුය.
    4. හවුල්කරුවන් සියලු දෙනාගේ එකඟතාව නොමැතිව නව හවුල්කරුවකු බඳවා ගැනීමට නොහැකි වීම.
    5. ව්‍යාපාරයේ සියළු ගිණුම් පොත්පත් ප්‍රධාන කාර්යාලයේ තිබිය යුතු අතර සෑම හවුල් කරුවකුටම ඒවා පරික්ෂා කළ හැකි වීම. (.....)

17. සංස්ථාපිත නොවූ ව්‍යාපාර සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
   1. වගකීම බොහෝ විට සීමා සහිත වේ.
   2. ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවේ.
   3. ලියාපදිංචිය අනිවාර්ය නොවේ.
   4. නීතිය ඉදිරියේ ව්‍යාපාරයේ නාමය පුද්ගලයෙකු ලෙස නොසලකයි.
   5. ලියාපදිංචිය සම්බන්ධයෙන් බලපාන්නේ පොදු නීති පද්ධතියකි. (.....)

18. සීමා සහිත පොදු සමාගමක කොටස් හා ණයකර මිලදීගන්නා ලෙස මහජනයාට ප්‍රසිද්ධ කරනු ලබන ආරාධනා පත්‍රය හඳුන්වන්නේ,
   1. ඇරයුම් පත්‍රය ලෙසය
   2. සංස්ථාපන සහතිකය ලෙසයි
   3. ව්‍යවස්ථාපිත ප්‍රකාශය ලෙසයි
   4. සංස්ථා ප්‍රකාශය ලෙසයි.
   5. වාර්ෂික වාර්තාව ලෙසයි. (.....)

19.

| X | Y |
|---|---|
| A රාජ්‍ය සමාගම් | 1. ප්‍රාග්ධනයක් රහිතව ආරම්භ කළ හැකිය. |
| B අක්වෙරළ සමාගම | 2. ව්‍යාපාර නාමය පුරස්කාරයට යටත්වේ. |
| C වරලත් ව්‍යාපාර | 3. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු තහනම්ය. |
| D ලැයිස්තුගත සමාගම් | 4. කොටස් වෙළඳපොලේ ලියාපදිංචි කෙරෙයි. |
| E ඇපයෙන් සීමිත සමාගම් | 5. රජයේ පාලනය යටතේ පවතී. |

ඉහත X හි ව්‍යාපාර සංවිධාන වර්ග ද Y හි ඒ හා සම්බන්ධ ප්‍රකාශ ද දැක්වේ. ඒ අනුව X හා Y නිවැරදිව ගැලපූවිට නිවැරදි යුගල කාණ්ඩය කුමක්ද?
   1. A - 5, B - 3, C - 4, D - 1, E - 2
   2. A - 5, B - 4, C - 3, D - 1, E - 2
   3. A - 1, B - 5, C - 2, D - 3, E - 4
   4. A - 1, B - 2, C - 5, D - 4, E - 3
   5. A - 5, B - 3, C - 2, D - 4, E -1 (.....)

20. පහත සඳහන් ව්‍යාපාර සංවිධානවල අවම සාමාජිකයන් ගණන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | **පෞද්ගලික සමාගම** | **පොදු සමාගම** | **ඇපයෙන් සීමිත සමාගම** | **සමුපාකාරය** |
|---|---|---|---|---|
| 1. | 2 | 2 | 2 | 10 |
| 2. | 1 | 1 | 2 | 10 |
| 3. | 1 | 2 | 1 | 7 |
| 4. | 2 | 1 | 1 | 10 |
| 5. | 1 | 1 | 2 | 7 |

(.....)

21. 1995 මැන්චෙස්ටර් සමුළු සංවිධානය විසින් ප්‍රකාශිත සමුපකාර ප්‍රතිපත්තියක් නොවන්නේ මින් කුමක්ද?
   1. සාමාජික ආර්ථික සමභාගිත්වය
   2. ස්වෛරීභාවය හා නිදහස
   3. සවන් යොමුකරවා ගැනීම.
   4. සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව
   5. ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය (.....)

22. හරිත ව්‍යවසායකත්වය යනු නව ව්‍යවසායකත්ව නැඹුරුතාවයයි. එයින් හැඳින්වෙන්නේ,
   1. සමාජමය වශයෙන් පවත්නා ගැටළුවලට විසඳුමක් ලෙස ව්‍යාපාරික අවස්ථා උත්පාදනය කරගනිමින් ව්‍යාපාර ආරම්භ කිරීමයි
   2. අළුතින්ම සොයාගන්නා ලද නිර්මාණයක් ඇසුරු කරගනිමින් නිෂ්පාදිතයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීමයි.
   3. කෘෂිකර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වයක් ඇතිව තිබෙන පිබිදීමයි.
   4. ස්වභාවික පරිසරයට යහපත් අයුරින් බලපාන ව්‍යාපාර කටයුතු ආරම්භකර පවත්වාගෙන යාමයි.
   5. ගෝලීය වශයෙන් අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යමින් විවිධ ජාතීන් හා සංස්කෘතීන්ට අනුකූලව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමයි. (.....)

23. ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර අන්තර් සම්බන්ධතාවයට පටහැනි ප්‍රකාශය තෝරන්න.
   1. ව්‍යවසායකත්වය තුළින් නව්‍යතා උත්පාදනය වන බැවින් ජාතික නිෂ්පාදිතය ඉහළ යයි.
   2. ව්‍යවසායකත්වය තුළින් නව රැකියා අවස්ථා උත්පාදනය වන බැවින් විරැකියාව අඩුවේ.
   3. නව රැකියා උත්පාදන හේතුවෙන් ආර්ථික වර්ධනය වේගවත් වේ
   4. ව්‍යවසායකත්වය හේතුවෙන් රටේ සම්පත් භාවිතය අවම වී විදෙස් ආනයන ඉහළ යයි.
   5. ව්‍යවසායකත්වය හේතුවෙන් දේශීය සම්පත් වලට ඇති ඉල්ලුම ඉහළ යයි. (.....)

24. ව්‍යවසායකත්වයේ ආයතනික ප්‍රතිලාභයක් නොවන්නේ,
   1. තරඟකාරිත්වයට පහසුවෙන් මුහුණදිය හැකි වීම.
   2. ව්‍යාපාර කටයුතු පුළුල් වීම.
   3. නව රැකියා අවස්ථා ජනිත වීම.
   4. වෙළඳපළ කොටස පුළුල් වීම.
   5. කර්මාන්තය පිළිබඳ විශේෂඥතාවක් ලැබීම. (.....)

25. සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ගීකරණය කිරීමේදී යොදාගෙන ඇති ප්‍රාග්ධනයේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන නොමැති ආයතනය වනුයේ,
   1. කාර්මික සංවර්ධන මණ්ඩලය
   2. කාර්මික තාක්ෂණ ආයතනය
   3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව
   4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
   5. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය (.....)

26. පහත සඳහන් ඒවා අතරින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිගැන්වීමට රජය විසින් සපයනු ලබන මූල්‍යමය දිරිගැන්වීමක් වන්නේ කුමක්ද?

| | | |
|---|---|---|
| 1. උපදේශණ සේවා | 2. වෙළඳපොළ පහසුකම් | 3. යටිතල පහසුකම් |
| 4. තාක්ෂණික පහසුකම් | 5. ණය පහසුකම් | (.....) |

27. ගණුදෙණු කළ නොහැකි ලියවිල්ලකි,

| | | |
|---|---|---|
| 1. සංචාරක චෙක්පත් | 2. විනිමය බිල්පත් | 3. ලාභාංශ බලපත්‍ර |
| 4. වාණිජ පත්‍රිකා | 5. පොරොන්දු නෝට්ටු | (.....) |

28. ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යත්ව කාර්යක් වන්නේ,

| | |
|---|---|
| 1. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම. | 2. වාණිජ බැංකු අධීක්ෂණය කිරීම. |
| 3. මුල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම | 4. රාජ්‍ය ණය කළමණාකරණය |
| 5. මහබැංකු පොලී අනුපාතිකය නියම කිරීම. | (.....) |

29. වාණිජ බැංකු විසින් පොලී අනුපාතයක් නොගෙවනු ලබන්නේ,
   1. කාලීන තැන්පතුවලටය.
   2. ඉල්ලුම් තැන්පතු වලටය
   3. අනේවාසික විදේශ ව්‍යවාර මුදල් තැන්පතු වලටය.
   4. ළමා ඉතුරුම් තැන්පතු ගිණුම්වලටය.
   5. මාසික නිර්නේවාසික ගිණුම්වලටය. (.....)

30. හර කාඩ්පතක් සම්බන්ධ පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. හර කාඩ්පත ණය පදනම මත නිකුත් කරයි.
   2. හර කාඩ්පතක් ලබාගැනීමට බැංකු ගිණුමක් අවශ්‍ය නොවේ.
   3. හර කාඩ්පතකින් කරනු ලබන ගෙවීම් සඳහා පොලියක් අය කෙරේ.
   4. හර කාඩ්පතක් ගනුදෙනුකරුගේ තැන්පතුවේ වටිනාකම මත නිකුත් කරයි.
   5. හර කාඩ්පතට රහස්‍ය අංකයක් නිකුත් නොකරයි. (.....)

- **අංක 31 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවලට සුදුසු වචනය, වාක්‍ය ඛණ්ඩය හිස්තැන මත ලියන්න.**

31. (අ) වර්තමානයේදී බොහෝ ව්‍යාපාර පවත්වාගෙනයාම සඳහා කේන්ද්‍රකර ගන්නේ .......................................... ............................................................. ය.

(ආ) රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරුවීමට අවස්ථා සැලසීමත් එමගින් ලෝක වෙළඳපොළ තුළ දැඩි තරඟකාරිත්වයක් ඇතිවීමත් ................................................................... පරිසර බලවේගයක් වන එය අයත් වන්නේ ................................................................ පරිසරයට වේ.

32. (අ) ව්‍යාපාරය විසින් සමාජයට ආපසු දෙන දෑ හඳුන්වන්නේ ............................................................ලෙසිනි.

(ආ) ව්‍යාපාර ආචාරධර්ම ලිඛිතව ප්‍රකාශයට පත්කළ විට එය හඳුන්වන්නේ .................................................... ලෙසිනි.

33. (අ) වාණිජ බැංකු හා ප්‍රාථමික වෙළඳුන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබාගැනීමේදී අය කරනු ලබන පොලී අනුපාතිකය ............................................. ලෙස හඳුන්වයි.

(ආ) ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණදෙන වාණිජ බැංකුවලට මහ බැංකුව අවසන් ණය ලබාදෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකය ............................................... ලෙස හඳුන්වයි.

34. ණය සීමා පැනවීම ...................................................... හා ............................................................ ලෙස වර්ග කර දැක්විය හැක.

35. (අ) සීමාසහිත පොදු සමාගමක කොටසක නිකුතු අගය ..........................................................................ලෙස හඳුන්වයි.

(ආ) නිකුත්කළ කොටස් සම්බන්ධයෙන් සහ කොටස්මත වූ ඇරයුම් සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු සියලු මුදල් වල එකතුව .............................................................................. ලෙස හඳුන්වයි.

36. (අ) ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ බලතල පැවරී ඇති ආයතනය වන්නේ ....................... .................................................................................................................. වේ.

(ආ) සමුපකාර සමිතියක් ලියාපදිංචිය සඳහා සිටියයුතු අවම සාමාජික සංඛ්‍යාව .......................................කි.

37. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව ව්‍යවසායකත්වය ........................................................ හා ............................ .................................. වන අතර, Oxford ශබ්ද කෝෂයට අනුව ව්‍යවසායකත්වය යනු ...................................... සහ ................................................ සම්බන්ධ වන පාලමකි.

38. (අ) පුද්ගල හැකියාවත් ප්‍රයෝජනයට ගත හැකි වීම, ව්‍යවසායකත්වයේ (අ) ....................................... ප්‍රතිලාභයක් වන අතර, අදායම් අවස්ථා ජනිත වීම ව්‍යවසායකත්වයේ (ආ) ....................................... ප්‍රතිලාභයකි.

(ආ) ව්‍යවසායකයා ................................. පුද්ගලයකුමෙන්ම දැරිය හැකි අවදානම් දරමින් ................................... සම්පාදනය කරනු ලබන පුද්ගලයකු වේ.

39. රජය විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන්ට ලබා දෙන ණය ................................ හා ....................... ණය ලෙස වර්ග කළ හැකිය.

40. (අ) මුදල් ඒකකයේ නිල අගය, එහි ද්‍රව්‍යමය අගයට සමාන වන්නේ එම් ඒවා හඳුන්වන්නේ .............................. මුදල් ලෙසය.

(ආ) ජාතික ඉතිරි කිරීමේ බැකුව ............................................... බැංකුවකි.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. වර්තමාන තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවී ඇති ප්‍රවණතා 4ක් ලියන්න.

    1. ..............................................................................................................................................
    2. ..............................................................................................................................................
    3. ..............................................................................................................................................
    4. ..............................................................................................................................................

42. ව්‍යාපාර සඳහා බලපෑම් එල්ල කරන්නාවූ ආසන්න පරිසර සාධක 2ක් හා සාර්ව පරිසර සාධක 2ක් පිළිවෙළින් නම් කරන්න.

    1. ..............................................................................................................................................
    2. ..............................................................................................................................................
    3. ..............................................................................................................................................
    4. ..............................................................................................................................................

43. ව්‍යාපාර ආයතනයක් සේවකයින් කෙරේ ඉටුකරන්නාවූ සමාජ වගකීම් 4ක් නම් කරන්න.

    1. ..............................................................................................................................................
    2. ..............................................................................................................................................
    3. ..............................................................................................................................................
    4. ..............................................................................................................................................

44. පරිසර කළමනාකරණ පද්ධතිවලට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතිය හා ව්‍යාපාරවල සමාජ වගකීම් වලට අදාළ ප්‍රමිතියක් පිළිවෙළින් නම් කරන්න.

    ......................................................................................................................................................

    ......................................................................................................................................................

45. පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත්කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් 4 සඳහන් කරන්න.

    1. ..............................................................................................................................................
    2. ..............................................................................................................................................
    3. ..............................................................................................................................................
    4. ..............................................................................................................................................

46. සංස්ථාපිත සමාගමක් ලියාපදිංචියට අදාළ ලියවිලි 4ක් නම් කරන්න.

    1. ..............................................................................................................................................
    2. ..............................................................................................................................................
    3. ..............................................................................................................................................
    4. ..............................................................................................................................................

47. 1844 දී රොච්ඩේල්හි සම්මත සමුපකාර ප්‍රතිපත්ති හතරක් සඳහන් කරන්න.

1. ........................................................ 2. ........................................................

3. ........................................................ 4. ........................................................

48. ව්‍යවසායකත්ව ක්‍රියාවලියට අයත් කාර්යයන් මොනවාද?

1. ........................................................ 2. ........................................................

3. ........................................................ 4. ........................................................

49. මුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිගැන්වීමට රජය සකසා ඇති ව්‍යාපෘති 4ක් නම් කරන්න.

1. ........................................................ 2. ........................................................

3. ........................................................ 4. ........................................................

50. චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව නම් කරන්න.

1. ........................................................ 2. ........................................................

3. ........................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 32 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................. ව්‍යාපාර අධ්‍යයනය II කාලය පැය තුනයි

- **උපදෙස් :- ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. (i) (අ) ව්‍යාපාරයක සත්‍ය සාර්ථකත්වයට අදාළ සාධක 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාරයක් විසින් වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබන වෙළඳපොළ පිළිගැන්වීම් කවරේද?(ලකුණු 2)

(ii) වර්තමානයේ සම්ප්‍රදායික ව්‍යාපාර ක්‍රම ඉවත් වෙමින් නව විද්‍යුත් ව්‍යාපාර ක්‍රමයකට බොහෝ ව්‍යාපාර ප්‍රවේශ වෙමින් සිටී.
(අ) විද්‍යුත් ව්‍යාපාර කෙරෙහි ව්‍යාපාර වැඩි නැඹුරුවක් දක්වන්නේ ඇයි? (ලකුණු 2)
(ආ) විද්‍යුත් ව්‍යාපාරයක දැකිය හැකි විශේෂ ලක්ෂණ කවරේද? (ලකුණු 2)

(iii) (අ) ව්‍යාපාරයක දැක්ම හා මෙහෙවර අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාරයක් අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කරන්නේ කවර හේතුන් නිසාද? (ලකුණු 2)

(iv) ව්‍යාපාරයක් සාර්ථකව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවධානය යොමුකළ යුතු වැදගත්ම සාධකය පරිසර අධ්‍යයනයයි. ව්‍යාපාර - පරිසර ප්‍රධාන කොටස් 2 මගින් එය කෙසේ සිදුවන්නේද යන්න ඔබේ අදහස් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(v) පාසලක් තුළ ක්‍රියාත්මක වන්නාවූ පරිසර සාධක කීපයක් පහත වේ.
විදුහල්පති, දෙමාපියන්, ශිෂ්‍යයන්, ප්‍රජාව, පාසල් සම්පත්, ගුරුවරු, අනධ්‍යන කාර්ම මණ්ඩලය, රජය, ආදි ශිෂ්‍ය සංගම්, අධ්‍යාපන අමාත්‍යාංශය.
(අ) ඉහත පරිසර බලවේග අභ්‍යන්තර හා බාහිර ලෙස වර්ග කරන්න. (ලකුණු 2)
(ආ) ඉහත පරිසර බලවේග අතරින් පරිසර බලවේග 2ක් තෝරා එය පාසලට ශක්තියක් හා අවස්ථාවක් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

02. (i) (අ) ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු දෙක නම් කරන්න. (ලකුණු 2)
(ආ) වෙළඳාම, කර්මාන්ත, වාණිජ්‍යය හා ව්‍යාපාර අතර පවතින සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) ''නිෂ්පාදිතය යනු අවශ්‍යතාවයකට ඇති විසඳුමකි'' පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දෙමින් වෙළඳපළ ජයගත් ව්‍යාපාරිකයෙකුගේ ප්‍රකාශයක් නම් ''තම ව්‍යාපාරයේ සාර්ථකත්වයට සැපයුම්කරුවන්ගේ යහපත් ක්‍රියා පිටුවහලක් වූ බවය''
(අ) ඉහත ප්‍රකාශයේ දක්වා ඇති සැපයුම්කරුවන් කුමන පරිසර බලවේගයකට අයත්ද? එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට සැපයුම්කරුවන් කෙසේ ඉවහල් වූයේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.(ලකුණු 2)
(ආ) පහත සඳහන්වන්නේ රටේ පවතින්නාවූත් ව්‍යාපාර කෙරේ බලපෑම් ඇති කරන්නාවූත් තොරතුරු සමුහයකි. ඒවා කුමන පරිසර බලවේගවලට අයත්දැයි තීරණය කරන්න.
1. කුඩා ව්‍යාපාර සඳහා ණයපොලී අනුපාතය 2% කින් අඩුවේ.
2. දැඩි නියඟයෙන් වී වගාවට හානි.
3. ප්‍රාදේශීය සභා සඳහා කාන්තා නියෝජනය වැඩි කරයි.
4. ඉරිදා දහම් පාසල අනිවාර්ය කෙරෙන අතර එදිනට පවතින උපකාරක පංති තහනම් කෙරේ.
(ලකුණු 2)

(iv) (අ) වර්තමානයේ ගොඩනැගිලි කර්මාන්තයේ බහුලව භාවිතා කරන්නාවූ අමුද්‍රව්‍යයක් ලෙස බ්ලොක්ගල් දැක්විය හැකි අතර මේ සඳහා වැලි භාවිතා කිරීම වැඩිවීම හා ඒ සඳහා වැලි ගොඩදැමීම නිසා ස්වභාවික පරිසරය අනාරක්ෂිත වී ඇත. මෙම හානියෙන් මිදීමටනම් තවත් පරිසර බලවේගයක් සමඟ අන්තර් සම්බන්ධතාවයක් පවත්වා ගත යුතුයි.
එම පරිසර බලවේගය නම්කර, එය සිදුකරගන්නේ කෙසේද යන්න කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 2)

(ආ) පරිසරයට අවිදිමත් ආකාරයට අපද්‍රව්‍ය මුදාහැරීම මගින් ශ්‍රී ලංකාව උග්‍ර පාරිසරික ගැටළුවකට මූණ දෙමින් සිටී. මෙම ගැටළුවෙන් මිදීම සඳහා 4 R සංකල්පයෙන් ඔබට දියහැකි උපදෙස් විස්තර කරන්න.
(ලකුණු 2)

(v) (අ) තිරසර සංවර්ධනය උදෙසා වර්තමාන ව්‍යාපාරිකයින් පරිසරය පිළිබඳ දැඩි අවධානයකින් කටයුතු කළ යුතුය. මේ සඳහා ව්‍යාපාරිකයින් කටයුතු කළයුත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) වර්තමාන ව්‍යාපාරිකයා දැඩි තරඟකාරිත්වයකට හසුවී ඇති බැවින් ව්‍යාපාරික අරමුණු ඉටුකරගැනීමේදී ඔහුගෙන් අභ්‍යන්තර, ආසන්න හා බාහිර පරිසරයන්ට අහිතකර වූ බලපෑම් එල්ලවේ. පහත සඳහන් සාධක අතුරින් 2ක් ගෙන එලෙසට අහිතකර බලපෑම් එල්ලවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 2)

03. (i) (අ) ව්‍යාපාරයන්හි සමාජ වගකීම යනුවෙන් අර්ථවත් වනුයේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 1)

(ආ) ව්‍යාපාරයන් විසින් විවිධ පාර්ශවයන් වෙත සිය සමාජ වගකීම් ඉටුකරනු ලබයි. ඒ අතුරින් සමාජය කෙරෙහි වගකීමට අයත් කාර්යයන් 06 දක්වන්න. (ලකුණු 3)

(ii) (අ) තිරසර සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි අර්ථ දක්වන්න. (ලකුණු 1)

(ආ) රටක ආර්ථික තිරසර සංවර්ධනය උදෙසා ව්‍යාපාරවලින් දායකත්වය ලබාදියහැකි ආකාර 06ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 3)

(iii) ව්‍යාපාර ආචාර ධර්ම යන්න අර්ථ දක්වා ව්‍යාපාරවලට ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේ වැදගත්කම කරුණු 6ක් මගින් දක්වන්න. (ලකුණු 4)

(iv) (අ) ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් වියයුතු සාධක 4ක් දක්වන්න.
(ලකුණු 2)

(ආ) අලෙවිකරණ ත්‍රිතයට අයත් ආචාරධර්ම 04ක් නම් කරන්න. (ලකුණු 2)

(v) (අ) රජය නීති රීති පැනවීම ව්‍යාපාර වලට බලපාන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන නීතිරීති පැනවීමේ කාර්යෙහි නිරතව සිටී. එම එකිනෙක ආයතන වල නීතිරීති පැනවීම සඳහා වෙන් වෙන් වශයෙන් උදාහරණය බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

04. (i) රජයේ ප්‍රධාන ආර්ථික අරමුණක් ලෙස "පූර්ණ සේවා නියුක්තිය" පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) රටක බාහිර මිල ස්ථායිතාව යනුවෙන් කුමක් අදහස් කරන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) රජයේ ආර්ථික අරමුණු ඉටුකරගැනීමට ව්‍යාපාර වලට දායක වියහැකි ආකාර 4ක් දක්වන්න
(ලකුණු 2)

(iii) (අ) රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවත්වාගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
(ලකුණු 2)

(ආ) රජයේ බදු නොවන ආදායම තුළ ඇතුළත් වන දෑ සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) (අ) 2016 මහ බැංකු වාර්තාව අනුව එම වසරේ රජයේ බදු ආදායම හා බදු නොවන ආදායම සමස්ථ ආදායමේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ලකුණු 2)

(ආ) ආනයනික භාණ්ඩ සඳහා රේගු බදු පැනවීම දේශීය ව්‍යාපාර වලට බලපාන අයුරු පැහැදිලි කරන්න.
(ලකුණු 2)

(v) (අ) පාරිභෝගික ආරක්ෂණය පාරිභෝගිකයාට වැදගත්වන අයුරු හෙවත් ඒ තුළින් පාරිභෝගිකයාට ඇති වාසි 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා ජාතික තත්ව සම්මානය (SLNQA) යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

## II කොටස

05. (i) (අ) ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය මගින් ක්‍රියාත්මක කරන ආනයන පිරික්සුම් වැඩසටහනේ අරමුණ පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දැක්ම සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) සමාජය තුළ විවිධ වූ සංවිධානයන් දක්නට ලැබෙන අතර ඒවා අතර බහුතරයක් ව්‍යාපාර සංවිධාන දක්නට ලැබේ.'' සංවිධානයක් හා ව්‍යාපාර සංවිධානයක් වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) විධිමත් සංවිධානයක දැකිය හැකි ලක්ෂණ හතරක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 2)

(iii) හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කොට රූප සටහනකින් දක්වන්න. (ලකුණු 4)

(iv) (අ) ව්‍යාපාර සංවිධාන අතර ඉතා ජනප්‍රිය ව්‍යාපාර සංවිධානය ලෙස කේවල ස්වාමි ව්‍යාපාර හඳුන්වා තිබේ. කේවල ස්වාමි ව්‍යාපාරයක් යනු නිදසුන් මගින් පැහැදිලි කර කේවල ස්වාමි ව්‍යාපාරයක විශේෂ ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ජයසංඛ ''ජයටෙක්ස්'' යනුවෙන් රෙදිපිළි අලෙවි සැලක් පවත්වාගෙන යාමට තීරණය කර තිබේ. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? නැද්ද යන්න දක්වා ඒ සඳහා අදාළ නෛතික තත්වය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 2)

(v) (අ) හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් බලපාන ප්‍රදාන නීතිය වන්නේ 1890 හවුල් ආඥාපණතයි. හවුල් ආඥා පණතේ දක්වා ඇති පරිදි හවුල් ව්‍යාපාරයක් අර්ථ දක්වන්න. (ලකුණු 2)

(ආ) හවුල් ව්‍යාපාර නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන්ම තිබිය යුතු ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

06. (i) (අ) හවුල් ව්‍යාපාරයක් බිහිවීම සඳහා හවුල්කරුවන් අතර ගිවිසුමක් ඇතිවිය යුතුය. හවුල් ගිවිසුම හා හවුල් ඔප්පුව වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) හවුල් කරුවන් අතර ඇතිවන මතභේද හා ආරවුල් විසඳා ගැනීමට හවුල් ඔප්පුවක් ඉතා වැදගත් වේ. එසේ මතභේදයන් හා ආරවුල් සමතයකට පත්කර ගැනීම සඳහා හවුල් ඔප්පුවක සඳහන් වියයුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) සීමාසහිත සමාගම්වල දැකිය හැකි වාසි හතරක් හා සීමා හතරක් වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) 2007 අංක 7 දරණ සමාගම් පණතට අනුව මෙරට තුළ ස්ථාපිත කළ හැකි මූලික සමාගම් වර්ග තුන නම්කර සමාගමක ''නිත්‍ය සන්තතික හැකියාව'' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) සමුපකාර ව්‍යාපාරයේ දක්නට ලැබෙන නව ප්‍රවණතා හතරක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) විශේෂිත ව්‍යාපාර වර්ගයක් ලෙස වරලත් ව්‍යාපාර වර්ථමානයේ ජනප්‍රිය වී තිබේ. වරලත් ව්‍යාපාරයක් යනු කුමක්දැයි හඳුන්වා වරලත් ව්‍යාපාර වර්ග කෙරෙන ආකාර සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) (අ) වර්ථමානයේ ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම ව්‍යාපාර ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. එසේ ව්‍යාපාර සංයෝජනය වියහැකි ආකාර දෙක සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) රජය හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වාගෙන යන හා පාලනය කෙරෙන සියළුම ව්‍යාපාර රාජ්‍ය අංශයේ ව්‍යාපාර ලෙස සැලකේ. රාජ්‍ය අංශය මගින් ව්‍යාපාර පවත්වාගෙන යාමට හේතුවූ කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) ඔබ ව්‍යවසායකත්ව කළමණාකරණ උපාධිය හදාරා අවසන් උපාධිධාරියෙකු බවත් ඔබ විසින් අඹ, දිවුල්, දොඩම්, නාරං, කාමරංගා වැනි දේශීය පළතුරු වලින් සකසන ලද ජෑම් සහ කෝඩියල් අපනයනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර ඇති බවත් සිතන්න මෙම ව්‍යවසායකත්ව කාර්යය හේතුවෙන් ඔබට, ඔබගේ ආයතනයට හා සමාජයට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම දක්වන්න. (ලකුණු 4)

07. (i) (අ) ව්‍යවසායකත්වය රටක ආර්ථික සමාජයීය හා පුද්ගල දියුණුව සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. එය එක් කාර්යයක් පමණක් නොවන අතර එය ක්‍රියාවලියකි. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පිළිවෙළින් දක්වන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර කැපී පෙනෙන වෙනස්කම් රාශියක් ඇත. ''ව්‍යවසායකයා'' යන්න හඳුන්වා ව්‍යාපාරිකයාත් ව්‍යවසායකයාත් අතර වෙනස්කම් මොනවාදැයි ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) ''ජැක් මා'' යනු ලෝක ප්‍රසිද්ධ අලි බාබා අන්තර් ජාතික සිල්ලර වෙළඳාම් කිරීමේ වෙබ් අඩවියේ නිර්මාතෘවරයා වේ. ඔහු කිහිපවතාවක්ම හාවඩ් විශ්ව විද්‍යාලයට ඇතුළත්වීමට උත්සාහ කළද අසාර්ථකත්වයට පත්විය. මුල්වරට චීනයට KFC හා Mcdonald ව්‍යාපාර හඳුන්වාදෙනු ලැබූ විට එම සමාගම්වල සේවය කිරීමට ඔහු විසින් ඉදිරිපත් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප විය. ඉන්පසු අන්තර්ජාලය තුළ චීන නිෂ්පාදන පිළිබඳ ඇති තොරතුරු ඉතා අල්ප බව අහඹු ලෙස සොයා ගත්තේය. ආපසු චීනයට පැමිණි ජැක් මා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ඇති පුද්ගලයන්ගේ සහාය ඇතිව අලි බාබා වෙබ් අඩවිය නිර්මාණය කළේය. ඒ හරහා මේ වන විට චීනයේ පමණක් නොව ලෝකයේ සියළුම රටවල් තම නිෂ්පාදිත ගණුදෙනු කිරීම සිදුකරනු ලබයි. මේ වන විට ඔහු අති සාර්ථක ව්‍යවසායකයෙකි.

මෙම කථාව ඇසුරෙන් ව්‍යවසායකයෙකු සතු විය යුතු ගති ලක්ෂණ පෙන්වා පැහැදිලි කරන්න.(ලකුණු 4)

(iii) (අ) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ මෙන්ම ව්‍යවසායක්ව කුසලතා ව්‍යාපාරිකයෙකුට ඉතා වැදගත්ය. ව්‍යවසායක්ව කුසලතා යනු මොනවාද? (ලකුණු 2)

(ආ) ඉහත සඳහන් ව්‍යවසායකත්ව කුසලතා හා ගතිලක්ෂණ වර්ධනය කරගත හැකි ආකාර මොනවාද? (ලකුණු 2)

(iv) (අ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත රටක ආර්ථික සංවර්ධනයට අතිශය වැදගත් සාධකයකි. දියුණු රටවල පවා 90% ක් පමණ රැකියා උත්පාදනය වනුයේ කුඩා ව්‍යාපාරවලින් බව නොරහසකි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ ඔබ දන්නා නිර්වචන ඇසුරින් ඔබගේම නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 2)

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ගීකරණය උදෙසා විවිධ නිර්ණායක භාවිතා කරයි. එම නිර්ණායක අතුරින් ප්‍රමාණාත්මක නිර්ණායක 3ක් හා ගුණාත්මක නිර්ණායක 3ක් දක්වන්න. (ලකුණු 2)

(v) (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේදී හා පවත්වාගෙන යාමේදී ව්‍යාපාරිකයින් සැලකිලිමත් වියයුතු කරුණු 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) බොහෝ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කර කෙටි කාලයකින් අසාර්ථකත්වයට පත්වේ. මෙසේ ඒ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 2)

08. (i) රටක ආර්ථික සංවර්ධනයට බෙහෙවින් ඉවහල් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අභිවෘද්ධිය උදෙසා රජය විවිධ දිරිගැන්වීම් ලබාදේ. එලෙස ලබාදෙන දිරිගැන්වීම් වර්ග 4ක් දක්වා එම දිරිගැන්වීම් ලබාදෙන රාජ්‍ය ආයතනය බැගින් නම් කරන්න. (ලකුණු 4)

(ii) (අ) මුදලේ කාර්යයන් 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) හුවමාරුවේදී භාවිතාවන පහත දැක්වෙන මුදල් වර්ග පැහැදිලි කරන්න.

1. ව්‍යවහාර මුදල් 2. ආසන්න මුදල්

3. බැංකු මුදල් 4. විද්‍යුත් මුදල් (ලකුණු 2)

(iii) (අ) කල්බදු යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි දක්වා මූල්‍ය කල්බදු හා මෙහෙයුම් කල්බදු අතර වෙනස්කම් 03ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) ආයෝජන කළඹක් යනු කුමක්දැයි හඳුන්වා ආයෝජන කළඹක යොදවන ආයෝජන මාර්ග 3ක් නම් කරන්න. (ලකුණු 2)

(iv) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙක නම් කරන්න. (ලකුණු 1)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යන් 6ක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 3)

(v) (අ) වාණිජ බැංකු පවත්වාගෙන යන ප්‍රධාන තැන්පතුවර්ග නම් කරන්න. (ලකුණු 1 1/2)

(ආ) බැංකු අයිරාව සහ බැංකු ණය සහ මූල්‍ය මාර්ග දෙක අතර ඇති වෙනස්කම් 5දක්වන්න.

(එක් වෙනසකට ලකුණු 1/2 බැගින් 5කට 2 1/2)

# දෙවන වාර පරීක්ෂණය - 2018
# 12 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
## I පත්‍රය

| | | |
|---|---|---|
| 01) - 2 | (11) - 3 | (21) - 3 |
| (02) - 2 | (12) - 4 | (22) - 4 |
| (03) - 4 | (13) - 2 | (23) - 4 |
| (04) - 5 | (14) - 5 | (24) - 3 |
| (05) - 4 | (15) - 2 | (25) - 5 |
| (06) - 3 | (16) - 2 | (26) - 5 |
| (07) - 2 | (17) - 1 | (27) - 1 |
| (08) - 3 | (18) - 4 | (28) - 4 |
| (09) - 3 | (19) - 5 | (29) - 2 |
| (10) - 1 | (20) - 2 | (30) - 4 |

31. (අ) ගණුදෙනුකරු (ආ) ගෝලීය, බාහිර
32. (අ) සමාජ වගකීම (ආ) ආචාරධර්ම සංග්‍රහය/පද්ධතිය
33. (අ) නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) (ආ) බැංකු පොලී අනුපාතිකය
34. ප්‍රමාණාත්මක ණය සීමා, ගුණාත්මක ණය සීමා
35. (අ) ප්‍රතිෂ්ඨාව (ආ) ප්‍රකාශකළ ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය
36. (අ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (ආ) අවම සාමාජික සංඛ්‍යාව 10 කි.
37. නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඇති හැකියාව, එය සාර්ථකව පවත්වාගෙන යාමේ හැකියාව, ප්‍රාග්ධනය සහ ශ්‍රමය
38. (අ) පුද්ගල, ආර්ථික (ආ) නිර්මානශීලී නවෘතා 39. කෙටිකාලීන, දිගුකාලීන
40. (අ) පූර්ණ මුදල් (ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.
41. 1. ගෝලීයකරණය ව්‍යාප්තවීම. 2. විද්‍යුත් ව්‍යාපාර බිහිවීම. 3. විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම.
    4. පරිසරය පිළිබඳව සැලකිලිමත්වීම. 5. ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳව සැලකිලිමත්වීම
42.

| **ආසන්න** | **සාර්ව** |
|---|---|
| පාරිභෝගිකයින් | ආර්ථික පරිසරය |
| සැපයුම්කරුවන් | දේශපාලන පරිසරය |
| තරඟකරුවන් | නෛතික පරිසරය |
| ආදේශක භාණ්ඩ සපයන්නන් | ස්වභාවික පරිසරය |
| විභව ආයෝජකයින් | සමාජ හා සංස්කෘතික පරිසරය |
| | ගෝලීය සංස්කෘතික පරිසරය |
| | විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය |

43. 1. සේවක ගරුත්වය රැකෙන පරිදි කටයුතු කිරීම.
    2. මනා වැඩ පරිසරයක් ඇතිකිරීම.
    3. සේවක සෞඛ්‍ය පහසුකම් සැලසීම.
    4. රැකියා සුරක්ෂිතභාවය
    5. මනා සේවක සම්බන්ධතා ගොඩනැගීම.
    6. සේවක පුහුණුව හා සංවර්ධනය
    (නිවැරදි කරුණු 4ක් සඳහන් කර ඇත්නම් එකකට 1/2 බැගින් 4කට ලකුණු 2)
44. පරිසර කළමනාකරණ පද්ධති ප්‍රමිතිය (ISO - 14001)
    සමාජ ගෙවීම් පිළිබඳව ප්‍රමිතිය (SA - 8000 / SA 5000)
45. 1. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇත අයිතිය
    2. වන්දි ලබාගැනීමට ඇති අයිතිය.
    3. පාරිභෝගික අධ්‍යාපනය ලබාගැනීමට ඇති අයිතිය.
    4. සෞඛ්‍යය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය.
46. 1. ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය
    2. සාංගමික ව්‍යවස්ථාවලිය
    3. සමාගමේ නම පිළිබඳ ප්‍රකාශනය
    4. සමාගමේ ලේකම් හෝ ලේකම්වරුන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලියවිල්ල
    5. අධ්‍යක්ෂ හෝ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලියවිල්ල.

47. 1. ස්වේච්ඡා හා නිදහස් සාමාජිකත්වය
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
3. සමුපකාර සමිති අතර සහයෝගීතාවය
4. අතිරික්තය සමව බෙදීම.
5. ප්‍රාග්ධනයට සීමිත පොළිය.
6. සමුපකාර අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.
7. ප්‍රජාව/සමාජය කෙරෙහි සැලකිලිමත්වීම.

48. 1. නව්‍යතා සම්පාදනය 2. සංකල්ප ගොඩනැගීම
3. සම්පත් සම්පාදනය 4. ප්‍රතිලාභ

49. 1. සහන්‍යා 2. සුවන 3. සමෘද්ධි 4. සණස ණය ව්‍යාපෘති

50. 1. අණකරු 2. අණලදු 3. ආදායකයා

## II - කොටස

01. (i) (අ) 1. ගුණාත්මක නිෂ්පාදිත සාධරණ මිලට සැපයීම. 2. නව්‍යතා සම්පාදනය
3. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා හොඳින් හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම.
4. මුල්‍ය කාර්ය සාධනය ළඟාකර ගැනීම. (ලාභ ලැබීම) 5. සේවක කැපවීම ලබාගැනීම.
6. සමාජ වගකීම් හා ව්‍යාපාර ආචාරධර්ම ඉටුකිරීම.
7. ව්‍යාපාරය කෙරෙහි ඇල්මැකී සියළුම පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලබාදීම.
(කරුණකට 1/2 බැගින් කරුණු 4ට ලකුණු 2යි)

(ආ) 1. භාණ්ඩ 2. සේවා 3. අදහස් 4. ඉසව් හා ක්‍රියාකාරකම් 5. ස්ථාන 6. පුද්ගලයින් 7. සංවිධාන 8. අත්දැකීම් 9. දේපළ 10. තොරතුරු (කරුණු 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(ii) (අ) සාම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාර පවත්වාගෙන යාම අද පවතින තරගකාරී ව්‍යාපාර පසුබිම තුළ කිසිසේත්ම තම අරමුණු ඉටුකර ගැනීමට ඇති හැකියාව අභියෝගයට ලක්ව ඇත. පරිසරයේ කොතරම් තර්ජන අභියෝග පැවැතියද ව්‍යාපාර හිමියෝ ඉහළ ඉපයීමක් අපේක්ෂා කරයි. ඒ සඳහා පවතින සාම්ප්‍රදායික ව්‍යාපාර ක්‍රමය තුළ කුමන ආකාරයේ නවීකරණ සිදුකළද, පිරිවැය කපාහැරීම ප්‍රමාණය අඩුකළද සියළු උපායයන් අසාර්ථක වී ඇත. ඒ සඳහා ඇති ඒකීය විසඳුම් විද්‍යුත් ව්‍යාපාර ක්‍රමයට අවතීර්ණ වීම බව ඔවුන්ගේ විශ්වාසය වී ඇති නිසා ව්‍යාපාරිකයෝ විද්‍යුත් ව්‍යාපාර කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි.
(ලකුණු 2)

(ආ) 1. ගනුදෙනුකරුවන්ට ඉතා සුළු කාල සීමාවක් තුළදී නිෂ්පාදිත ලබාදීමට ඇති හැකියාව.
2. වෙබ් අඩවියට පිවිස දත්ත, තොරතුරු පරික්ෂා කර බලා ගනුදෙනු පහසුවෙන් සිදුකළ හැකිවීම.
3. නිෂ්පාදිතයට අදාළ විවිධ තොරතුරු සැපයෙන නිසා නිෂ්පාදිතයේ වටිනාකම වැඩිවීම.
4. ගනුදෙනුකරුගේ ඉල්ලීමට අනුව නිෂ්පාදිත අවශ්‍ය වේලාවට අවශ්‍ය ස්ථානයේදී සැපයීම.
5. බහුමාධ්‍ය පහසුකම් ලබාගත හැකිවීම. (කරුණු 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(iii) (අ) ආයතනය අනාගතයේ කවර තත්වයකට පත්වන්නේ ද යන්න පිළිබඳ දිගුකාලීන දර්ශණය දැක්ම හෙවත් දෘෂ්ඨිය වේ. මෙමගින් ආයතනයේ සමස්ථ කාර්යභාරය සම්පිණ්ඩනය කොට දක්වයි. ආයතනයේ ස්වභාවය හා ගමන් මර්ගය දක්වෙන පරිදි ආයතනය වෙනත් ආයතනවල කාර්යභාරයෙන් වෙන්කොට හඳුනාගැනීමට ඉවහල්වනදේ අඩංගු සංක්ෂිප්ත ප්‍රකාශය මෙහෙවරයි. ව්‍යාපාරයක දැක්ම සාක්ෂාත් කරගැනීමට සිදුකළයුතුදේ මෙහෙවර ප්‍රකාශනයේ දැක්වේ. එනම් දැක්ම මත මෙහෙවර පදනම් වේ.

(ආ) 1. ව්‍යාපාරය මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂිත දේ කුමක්ද යන්න සංවිධානයේ සියලු දෙනාටම පැහැදිලි කිරීම.
2. ව්‍යාපාරයේ මානව හා භෞතික සම්පත් ඵලදායී ලෙස සංවිධානය කිරීමට කළමණාකරුවන්ට අවස්ථාව ලබාදීම.
3. කළමනාකරුවන්ට හා සේවකයන්ට ඔහුන්ගේ කටයුතු සංවිධානය කරගැනීමේදී පහසුවක් ඇතිකිරීම.
4. සේවකයින් අභිප්‍රේරණය කිරීම. 5. පරිසරයේ ඇති අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ හැකියාව ලබාදීම.
(කරුණකට 1/2 බැගින් කරුණු 4ට ලකුණු 2යි)

(iv) කොටස් 2යි. අභ්‍යන්තර හා බාහිර පරිසරය.
ඉහත පරිසර කොටස් 2ට අයත් පරිසර සාධක ව්‍යාපාරයට ශක්තියක් හා දුර්වලතාවයක් ගෙන දෙන ආකාරයත් අවස්ථා හා තර්න ගෙන දෙන ආකාරයත් (ශ.දු.අ.ත.) විස්තර කරමින් දුර්වලතා හා තර්ජන මඟහරවා ගනිමින්ද ශක්තීන් හා අවස්තා වර්ධනය කරගැනීමට කටයුතු කරමින් ව්‍යාපාරයේ සාර්ථක කරගැනීම පිළිබඳ කරුණු විස්තර වී ඇත්නම් ලකුණු දෙන්න.
(බෙදා දක්වීමට ලකු 1යි. සම්පූර්ණ විස්තරයට ලකුණු 3යි. එසේ නොමැතිනම් අදාළ පරිදි ලකුණු ප්‍රධානය කරන්න.)

(v)(අ) **අභ්‍යන්තර** **බාහිර**

| | |
|---|---|
| **අභ්‍යන්තර** | **බාහිර** |
| විදුහල්පති | දෙමාපියන් |
| ශිෂ්‍යයන් | ප්‍රජාව |
| පාසල් සම්පත් | රජය |
| ගුරුවරු | ආදි ශිෂ්‍ය සංගම් |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යාපන අමාත්‍යාංශය |

(ඉහත කරුණු නිවැරදිව සඳහන් කර ඇත්නම් එක පැත්තකට ලකුණු 1 බැගින් දෙපැත්තට ලකුණු 2යි. එකක් හෝ වැරදි නම් එක පැත්තකට ලකුණු 1/2 යි.)

(ආ) ඉහත පරිසර බලවේග අතරින් අභ්‍යන්තර සාධක වලින් ශක්තියක් ගෙන දෙන සාධකත් බාහිර සාධක අතුරින් අවස්ථාවක් ගෙන දෙන සාධකත් තෝරා තිබිය යුතුය. එම සාධක දෙක ශක්තියක් හා අවස්ථාවක් වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුය. උදා : විදුහල්පති දක්ෂ දැනුම ඇති පරිපාලකයෙකු වීම ශක්තියක්ද, රජය සම්පත් නිසි අයුරින් සපයමින් පාසල් සඳහා වැඩි මුදල් ප්‍රතිපාදනයක් සිදුකිරීම අවස්ථා වේ.

(නිවැරදිව සාධක දෙකක්ගෙන ඇත්නම් ලකුණු 1 එම සාධක දෙක අදාළ පරිදි විස්තර වී ඇත්නම් ලකුණු 1 බැගින් මුලු ලකුණු 2)

02. (i) (අ) 1. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම. 2. සම්පත්වලට අගය එකතු කිරීම. (ලකුණු 2)

(ආ) වෙළඳාම, වාණිජ්‍යය, ව්‍යාපාර හා කර්මාන්ත යන සංකල්ප එකිනෙකට බැඳී පවතී. මෙම සම්බන්ධතාවය පහත පරිදි නිරූපණය කළ හැකියි.




(ලකුණු 2)

(ii) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වෙළඳපොළට ඉදිරිපත්කරන ඕනෑම දෙයක් නිෂ්පාදිතයක් වේ. නිෂ්පාදිතයක් මගින් සිදුවනුයේ අවශ්‍යතාවන් හා ඒ මත පදනම් වූ වුවමනාවන් සපුරාලීමයි. අවශ්‍යතාවයක් යනු පාරිභෝගිකයෙක් සම්බන්ධයෙන් වූ විට ගැටලුවකි. උදාහරණ ලෙස අවශ්‍යතාවය ගතහොත් එය පාරිභෝගිකයාට ගැටලුවක් වේ. එනම් ආහාර අවශ්‍යතාවය සපුරාගන්නා තෙක් එය ගැටලුවක් වේ. ආහාර අවශ්‍යතාවය සම්පූර්ණ වූ විට ගැටලුව විසඳේ. එය සම්පූර්ණ වනුයේ නිෂ්පාදිතයක් මගිනි. ඕනෑම නිෂ්පාදිතයක් අවශ්‍යතාවයකට විසඳුමක් ලෙස සැලකෙන්නේ මේ නිසාය. (ලකුණු 2)

(iii) (අ) කලට වේලාවට ගුණාත්මක ද්‍රව්‍ය සැපයීම, වට්ටම් සහනලබාදීම ගෙවම් ක්‍රම අනුගමනය කිරීම, ණය පදනම මත ද්‍රව්‍ය සැපයීම යනාදිය.

(ඉහත කරුණු අඩංගු පිළිතුරට ලකුණු 2 කරුණු අඩුනම් ලකුණු 1 දෙන්න)

(ආ) 1. ආර්ථික පරිසරය 2. ස්වභාවික පරිසරය 3. දේශපාලන පරිසරය 4. නෛතික පරිසරය

(කරුණු 4ම නිවැරදිනම් එක පිළිතුරකට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි)

(iv) (අ) ස්වභාවික පරිසරයට සිදුවන හානිකර තත්වයන් නවතාලීම හෝ මැඩ පැවැත්වීමට අනිවාර්යයෙන් නීති රීති පැනවිය යුතුවේ. දඬුවම් ලබාදිය යුතුවේ. මෙහිදී වැලිගොඩදැමීමට එරෙහිව නෛතික පරිසරය ක්‍රියාත්මක වියයුතු අතර ඒ සඳහා ඉහත ක්‍රියාමාර්ග ගැනීම මගින් පරිසර දෙක අතර අන්තර් සම්බන්ධතාව තුළින් පරිසර හානි අවම කර ගැනීමට කටයුතු කළ හැක.

(ඉහත ආකාරයට විස්තර වන්නාවූ පිළිතුරට ලකුණු 2ක් ලබාදෙන්න. එසේ නොමැතිනම් දී ඇති පිළිතුරට අනුව ලකුණු 1 දෙන්න)

(අ) Recycle - (ප්‍රතිචක්‍රීකරණය) Reuse - (නැවත නැවත භාවිතා කිරීම)

Reduce - (භාවිතය අඩුකිරීම) Replace - (නැවත ස්ථාපිත කිරීම)

__**ප්‍රතිචක්‍රීකරණය :**__ අමුද්‍රව්‍ය වෙන්කොට වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කළහැකි ද්‍රව්‍යයක් බවට පත්කිරීම.

__**නැවත නැවත භාවිත කිරීම්**__ නිෂ්පාදන කාර්යයේදී හෝ පාරිභෝජනයේදී නැවත නැවත කළහැකි දේ යෙදීම.

__**භාවිතය අඩුකිරීම්**__ නිෂ්පාදනය හෝ පාරිභෝජය සඳහා යොදාගන්නා දෑ වලින් පරිසරයට මුදාහරින ලද දෑ අවම කිරීම.

__**නැවත ස්ථාපිත කිරීම්**__ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන ස්වභාවික සම්පත් නැවත පරිසරයේ ස්ථාපිත කිරීම.

(ඉහත තොරතුරු 4ම විස්තර කර ඇති පිළිතුරට ලකුණු 2යි. එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු විස්තර කර තිබිය යුතුය)

(v) (අ) ව්‍යාපාරයක් එහි පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා ළඟාකර ගැනීමට උපාය මාර්ග ක්‍රියාකාරකම් තේරීමේදී පරිසරයේ මානව හා ස්වභාවික සම්පත් ආරක්ෂා කරගනිමින් වැඩි දියුණු කරමින් අමුද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැකගනිමින් කටයුතු කළයුතුය යන්නයි.

(ඉහත ආකාරයට පිළිතුර ඉදිරිපත් වී නම් ලකුණු 2යි. එසේ නොමැතිනම් අදාළ කරුණු සලකා බලමින් ප්‍රමාණවත් ලකුණක් ලබාදෙන්න)

(ආ) පාරිභෝගිකයාට - * වැඩි ලාභ අරමුණ නිසා ගුණත්වයෙන් අඩු භාණ්ඩ නිෂ්පාදනය

* පාරිභෝගිකයන් රැවටීම. (භාණ්ඩ බාල කිරීම, මිශ්‍ර කිරීම, මිල හා දින වෙනස් කිරීම)

සේවකයන්ට - * සේවක උසස්වීම් හා වැටුප් වැඩිකිරීම් සිදුනොවීම.

* සේවක සුභසාධනය අඩුවීම.

ස්වභාවික පරිසරයට - * පරිසරයට අපද්‍රව්‍ය බැහැර කරමින් පරිසර දූෂණය

* සම්පත් නාස්තිවන අයුරින් පරිහරණය

(ඉහත සාධකවලින් 2ක් විස්තරවී ඇත්නම් එක් සාධකයකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2ක් දෙන්න)

03. (i) (අ) ව්‍යාපාරවල ලාභ ඉලක්ක ළඟාකර ගැනීම පමණක් නොව ඉන් ඔබ්බට <u>විහිදී යන සමාජය වෙනුවෙන් වූ ව්‍යාපාර සතු බැඳීයාමයි.</u>

(ඉරි ඇඳි පදය සහිත නිවැරදි අදහස ඇත්නම් ලකුණු 1යි)

(ආ) 1. හරිත නිෂ්පාදිතයන් කරා යොමුවීම. 2. පරිසර හිතකාමී වීම. 3. අපද්‍රව්‍ය කළමණාකරණය 4. සේවා නියුක්ති අවස්ථා වැඩිකිරීම. 5. මානව හිමිකම් සුරැකීම. 6. ප්‍රජා සත්කාර කටයුතුවල නිරත වීම. 7. රජයට නිසි පරිදි බදු ගෙවීම.(නිවැරදි කරුණට ලකුණු 1/2 බැගින් කරුණු 6කට ලකුණු 3යි)

(ii) (අ) අනාගත පරපුරකට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාව කැප නොකරමින් වර්තමාන පරපුරේ අවශ්‍යතා සපුරාගැනීම තිරසර සංවර්ධන ලෙස හැඳින්වේ

(මෙම අදහස ඇතුළත්ව තරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 1)

(ආ) 1. ඉහළම කාර්යක්ෂමතාවයෙන් හා සඵලදායීතාවයෙන් යුක්තව නිෂ්පාදන කටයුතු කළමනාකරණයෙන් කටයුතු කර සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම. 2. අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම භාවිතයට ගැනීම. 3. විද්‍යුත් තාක්ෂණික ක්‍රම උපයෝගීකර ගනිමින් භාවිතාවන ලිපිද්‍රව්‍ය, ගමන් පිරිවැය, කාලය ආදී දේවල් අවම කර ගැනීම සහ ඒ තුළින් සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම. 4. වාහන භාවිතය අවම කර ගැනීමට ක්‍රමවේද සැකසීම ඒ තුළින් ඉන්ධන භාවිතය අඩු කිරීම. 5. විශාල ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර වලින් උපරිම ප්‍රයෝජන ගැනීම. 6. ආයතනය සතු සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කොට අනාගත පරපුරට ඒවා ඉතිරිකරදීම විශාල යුතුකමක් බව සේවකයින්ට මනාලෙස පැහැදිලි කරමින් යෝග්‍ය ලෙස මානව සම්පත් කළමනාකරණය කිරීම. 7. රටක ජනතාවට අවශ්‍ය භාණ්ඩ පමණ් නිපදවීමට සම්පත් යෙදවීම සහ රටට අනවශ්‍ය භාණ්ඩ නිපදවීම නොකිරීම. (ඕනෑම නිවැරදි කරුණු 6කට ලකුණු 3)

(iii) ව්‍යාපාර ආචාරධර්ම යනු ව්‍යාපාරයක් විසින් තමාටත්, තම සේවකයින්ටත්, තමන් සමඟ ගනුදෙනු කරන විවිධ පාර්ශවයන්ටත් පුළුල් වශයෙන් සමස්ථ සමාජයටත් යහපතක් වන ආකාරයට හොඳ හා නරක පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීමයි. (මෙම අදහස ඇත්නම් ලකුණු 01)

වැදගත්කම :

1. ව්‍යාපාර විසින් සකසා ඇති ආචාරධර්ම වලට අනුකූලව කටයුතු කිරීමෙන් ව්‍යාපාර තුළ විනයානුකූල පරිසරයක් ගොඩනැගීම. 2. ඉතා තෘප්තියෙන් හා මනා අභිප්‍රේරණයෙන් යුක්ත සේවක හමුදාවක් ව්‍යාපාරය තුළ සිටීම. 3. ව්‍යාපාරයේ නිෂ්පාදිතවලට ඇති ඉල්ලුම ඉහළ යාම. 4. ඉහළ කීර්තිනාමයක් ඇතිවීම හා ඒ තුලින් සේවක ආකර්ෂණය ඉහළ යෑම. 5. බාහිර පාර්ශවයන් ව්‍යාපාරය කෙරෙහි විශාල විශ්වාසයක් හා බලාපොරොත්තුවක් ඇතිකර ගැනීම. 7. ව්‍යාපාරයට හා පාරිභෝගිකයින්ට හිතකර වන ආකාරයට යහපත් තරගකාරිත්වයක් ගොඩනැගීම.

(එකකට ලකුණු 1/2 බැගින් ඕණෑම කරුණු 6කට ලකුණු 3)

(iv) (අ) 1. ව්‍යාපාරය 2. ගනුදෙනුකරු 3. සේවකයින් 4. තරඟකරුවන් 5. සමාජ සංස්කෘතිය හා සංවිධාන සංස්කෘතිය. 5. ව්‍යාපාර සම්පත් 6. ප්‍රායෝගික බව.

(එක කරුණකට 1/2 බැගින් ඕනෑම කරුණු 4කට ලකුණු 2)

(ආ) 1. සත්‍ය කරුණු පමණක් සන්නිවේදනය කිරීම. 2. සඳහන් මිල වෙනස් නොකිරීම, මිශ්‍ර කිරීම් නොකිරීම නිවැරදිව කිරුම් මිනුම් කටයුතු කිරීම. 3. තව දුරටත් ගනුනෙු කරුවන් නොරැවටීම. 4. සාධාරණව හා අවංකව තරග කිරීම. 5. සාධාරණ මිලක් නියම කිරීම. 6. පොදුවේ පිළිගත් ප්‍රමිතීන්වලට අනුකූලවන අයුරින් භාණ්ඩ අලෙවි කිරීම. 7. හරිත නිෂ්පාදිත අලෙවි කිරීමට උනන්දුවීම. 8. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම. (ඕනැම නිවැරදි කරුණු එකකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2)

(v) (අ) රජය විසින් පනවනු ලබන නීතිරීති ව්‍යාපාර වලට පිළිපැදීමට සිදුවේ. ඇතැම්විට නව නීති වලින් ඇතැම් ව්‍යාපාර කටයුතු තහනම් කිරීම, සීමා කිරීම, බලපත්‍ර හා ගාස්තු ඉහළදැමීම ආදිය සිදුවේ. එවිට එම නීතිරීති ඍජුවම ව්‍යාපාර වලට බලපෑම් ඇතිකරනු ලබයි. (පැහැදිළි කිරීමට ලකුණු 2)

(ආ) මධ්‍යම රජයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ප්‍රමිති පනත ආදිය
පළාත් සභාවේ පෞද්ගලික බස්රථ සඳහා නීති රීති පැනවීම ආදිය.
පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම, සැලසුම් අනුමත කිරීම ආද නීතිරීති පැනවීම.
(උදාහරණ ගැළපෙන පරිදි කොටස් 3ටම සැපයීමට ලකුණු 2)

04. (i) ආර්ථිකයක් සතු සියලුම නිෂ්පාදනය සම්පත් ඵලදායී නිෂ්පාදන කාර්යයන්හි නිරත කර තිබීම පූර්ණ සේවා නියුක්තියයි. ප්‍රධාන වශයෙන් ශ්‍රමය සැපයීමට සූදානම්ව ශ්‍රම බලකායේ සිටින සියලු දෙනා කිසියම් රැකියාවක නියුක්ත වීමද මෙහිදී සලකා බලනු ලබයි. (පැහැදිලි කිරීමට ලකුණු 4)

(ii) (අ) රටක විදේශ විනිමය අනුපාතිකය ස්ථාවර මට්ටමක රඳවා ගැනීම බාහිර මිල ස්ථායිතාව ලෙස හැඳින්වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) * බදු ගෙවීම * දේශීය සම්පත් භාවිතය * රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම.
* නීතිරීති පිළිපැදීම * සේවා නියුක්තියට දායක වීම. * පරිසරයට වන හානිය අවම කිරීම.
(කරුණු 4කට ලකුණු 2)

(iii) (අ) රජය විසින් ව්‍යාපාර වලට පහසුකම් හා සහන සැපයීම තුළ ව්‍යාපාර වර්ධනය වන අතර එමගින් රජයේ අරමුණුද ඉටුවේ. එනම් රටේ දැ.දේ.නි. ඉහළයාම, සේවා නියුක්තිය ඉහළයාම, දේශීය සම්පත් භාවිතය ඉහළයාම, රජයට විශාල බදු මුදලක් උපයාගත හැකිවීම වැනි දෑ ඒ අතර වේ. එමෙන්ම එම බදු මුදල් යොදාගෙන රටේ යටිතල පහසුකම් සංවර්ධනය කලහැකි වීමද මෙම අන්‍යෝන්‍ය සම්බන්ධතාවයේ වැදගත්කම අවධාරණය කරයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) * රජයේ ආයතන වලින් ලබන ලාභ හා ලාභාංශ. * ගාස්තු හා අයකිරීම්. * පොලී ආදායම් * වෙනත් ආදායම්.
(කරුණු 4කට ලකුණු 2)

(iv) (අ) බදු ආදායම - 87% බදු නොවන ආදායම - 13% (කරුණු 2ට ලකුණු 2)

(ආ) ආනයනික භාණ්ඩ මත රේගු බදු පැනවීමෙන් ආනයන ප්‍රමාණය සීමා වන අතර ආනයනික භාණ්ඩවල මිල ගණන්ද ඉහළ යනු ඇත. එවිට ආනයන සඳහා ඇති ඉල්ලුම අඩුවී දේශීය නිෂ්පාදනය වර්ධනය කර ගැනීමේ හැකියාව ලැබේ. එමෙන්ම දේශීය කර්මාන්ත ආරක්ෂාකර ගැනීමේ හැකියාවද ලැබේ.
(පැහැදිලි කිරීමට ලකුණු 2)

(v) (අ) * ගෙවන මුදලට සරිලන වටිනාකමක් සහිත භාණ්ඩ පාවිච්චියට ඉඩකඩ ලැබීම.
* වෙළඳ විෂමාචාර වලින් ආරක්ෂාවීමේ හැකියාව ලැබීම.
* ගුණාත්මක භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවකාශ ලැබීම. (පාරිභෝගික සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරුවීම) * අවශ්‍ය නීතිමය රැකවරණය ලැබීම. * පාරිභෝගිකයාට ජීවත්වීමට සුදුසු පරිසර තත්වයේ උදාවීම. (කරුණු 4ට ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාව තුළ පවතින ආයතන ගුණත්ව කළමනාකරණය හා ගුණත්ව අත්පත් කරගැනී කෙතරම් දුරට පවත්වාගෙන යන්නේද යන්න ඇගයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය මගින් ශ්‍රී ලංකා ජාතික තත්ව සම්මානය වාර්ෂිකව පිරිණමනු ලබයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

05. (i) (අ) ආනයන පිරික්සුම් වැඩසටහනේ අරමුණ වන්නේ අදාළ ශ්‍රී ලංකා ප්‍රමිත පිරිවිතරයන්ට අනුව ආනයනික නිෂ්පාදන සමීප ලෙස නිරීක්ෂණයට හා පිරික්සුමට ලක් කෙරෙන බව සහතික කිරීම හා ශ්‍රී ලංකා රේගුවට අවශ්‍ය නිර්දේශ ලබා දීමයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) සදාචාරාත්මක ව්‍යාපාර පරිසරයක් තුළ සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දැක්මයි (ලකුණු 2යි)

(ii) (අ) සංවිධාන
පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒකරාශීවී සිටින පුද්ගල කණ්ඩායමින් සැදුම්ලත් සමාජ ඒකකයක් සංවිධානයක් වේ. උදා : පාසැල, පන්සල, පල්ලිය, වෙළඳ සැල.
(නිවැරදි පැහැදිලි කිරීම් සහිත පිළිතුරට ලකුණු 1යි)

ව්‍යාපාර සංවිධාන
ලාභ ඉපයීම හෝ සමාජ සුබසාධනය අරමුණුකරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරීම, බෙදා හැරීම හා අලෙවි කිරීමේ නිරත ව්‍යවසායන් ව්‍යාපාර සංවිධාන වේ. උදා : කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම්. (නිවැරදි පැහැදිලි කිරීම් සහිත පිළිතුරට ලකුණු 1යි)

(ආ) 1. ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණක් තිබීම. 2. විවිධ කටයුතු ඉටුකිරීම සඳහා පුද්ලලයින් සිටීම. 3. සංවිධාන ව්‍යුහයක් පැවතීම. 4. අනන්‍යතාවය සඳහා නමක් තිබීම. 5. විවිධ සම්පත් භාවිතාකිරීම. 6. වකීමක් තිබීම.
(ඕනෑම කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(iii)



(iv) (අ) හිමිකාරිත්වය තනි පුද්ගලයෙකු සතුවන ව්‍යාපර කේවල ස්වාමි ව්‍යාපාර වේ. උදා : තනි පුද්ගල ව්‍යාපාරයක ඕනෑම නමක්. (නිදසුනක් සහිත පැහැදිලි කිරීමට ලකුණු 1යි)

<u>කේවල ස්වාමි ව්‍යාපාරයක විශේෂ ලක්ෂණ :</u>

1. අයිතිකරු විසින් තනිව ප්‍රාග්ධනය සපයා තිබීම.
2. කළමනාකරණ තීරණ ගනුයේ අයිතිකරු විසින් වීම.
3. අයිතිකරුගේ අසීමිත වගකීම
4. නෛතික පුද්ගලභාවය නොමැතිවීම.
5. ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
6. ලාභ හෝ අලාභ තනිව භුක්ති විඳීම.
7. අවදානමට තනිව මුහුණ දීම.
8. අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම 9. ගිණුම් තැබීම අනිවාර්යනොවීම.
10. ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් සිදු නොවීම.

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(ආ) ලියාපදිංචි කළ යුතුය (ලකුණු 1/2 කි)

කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් <u>1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥා පණත</u> පදනම් කරගෙන ව්‍යාපාරය අයත් <u>පළාත් සභාවේ ව්‍යාපාර නාම පඥ්ඥප්තිය</u> අනුව අදාළ <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්</u> ලියාපදිංචි කරගත යුතුවේ.

(ඉරි ඇඳි පද සහිත නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 1 1/2)

(v) (අ) ''ලාභ ලැබීමේ අරමුණින් සියල්ලන් විසින් හෝ සියල්ලන් වෙනුවෙන් ඔවුන් අතුරින් කවරකු හෝ වයාපාර කරගෙන යාම සඳහා පුද්ගලයන් කිහිපදෙනෙකු අතර ඇතිවන සම්බන්ධතාවය හවුල් ව්‍යාපාරයකි''

(ඉහත පිළිතුර නිවැරදිව ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 2කි)

''ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර පවත්නා ව්‍යාපාරික සම්බන්ධතාවය හවුල් ව්‍යාපාරයකි.'' (මෙම පිළිතුර ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 1යි)

(ආ) 1. ලාභ ලැබීමේ අරමුණක් තිබීම. 2. ව්‍යාපාර කටයුත්තක් පැවතීම. 3. පුද්ගලයින් සිටීම.
4. අන්‍යොන්‍ය සම්බන්ධතාවක් (එකඟතාවක්) තිබීම. (කරුණකට 1/2 බැගින් කරුණු4 කට ලකුණු 2යි)

06. (i) (අ) හවුල් ගිවිසුමඃ හවුල් ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කොට පවත්වාගෙන යාම ම්බන්ධයෙන් හවුල් කරුවන් අතර ඇති කරගනු ලබන එකඟතාව හවුල් ගිවිසුමයි. හවුල් ගිවිසුම ව්‍යංගයෙන්, වාචිකව හෝ ලිඛිතව ඇතිවිය හැකිය. (නිවැරදි පැහැදිලි කිරීම් සහිත පිළිතුරට ලකුණු 1යි)

හවුල් ඔප්පුව : හවුල්කරුවන් අතර ඇතිකරගන්නා ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුවයි. මෙහි සියළු හවුල්කරුවන් අත්සන් තැබිය යුතු වේ. (නිවැරදි පැහැදිලි කිරීම් සහිත පිළිතුර ලකුණු 1කි)

(ආ) 1. ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර. 2. ලාභ අලාභ බෙදාගන්නා ආකාරය පිළිබඳ තොරතුරු 3. හවුල් කරුවන්ගේ ගැනිලි පිළිබඳ සීමා. 4. ප්‍රාග්ධන පොලී හා ගැනිලි පොලී පිළිබඳ කොන්දේසි. 6. අමතර ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ කොන්දේසියි. 7. නව හවුල්කරුවකු බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි. (මතභේදයන්ට බලපාන කරුණු පමණක් ඇති පිළිතුරට කරුණකට 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(ii) (අ) <u>සීමාසහිත සමාගම්වල වාසි :</u>

1. විශාල ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම. 2. මහා පරිමාණ ව්‍යාපාර අරම්භකළහැකි වීම.
3. දක්ෂ කළමනාකරුවන් බඳවානෙ ව්‍යාපාර කටයුතු කරගෙන යාහැකි වීම. 4. කොටස් කරුවන්ගේ වගකීම සීමාසහිතවීම නිසා ආයෝජකයන් ආකර්ෂණය කරගත හැකිවීම. 5. කොටස්කරුවන්ගේ මරණය හෝ ඉවත්වීම ව්‍යාපාරයේ පැවැත්මට හානියක් නොවීම. 6. ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශී කරගතහැකිවීම. 7. ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් තිබීම. (වාසි දෙකකට ලකුණු 1/2 බැගින් වාසි හතරකට ලකුණු 1යි)

<u>සීමාසහිත සමාගම්වල සීමා :</u>

1. නීතිමය බලපෑම් දැඩිවීම. 2. ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළයුතු වීම හා ඒ සඳහා පිරිවැයක් දැරියයුතු වීම. 3. කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවීම නිසා සුළු කොටස්කරුවන්ට වැඩි

බලයක් හිමි නොවීම. 4. සමාගමේ ලාභය මත මෙන්ම කොටස් කරුවන්ට හිමිවන ලාභාංශ මත ද බදු ගෙවීමට සිදුවීම නිසා ලාභ ද්විත් බදු ගණයකට හසුවීම. 5. විසුරුවා හැරීමේදී සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදුවීම.(සීමා දෙකකට ලකුණු 1/2 බැගින් සීමා හතරකට ලකුණු 1යි)

(ආ) 1. සීමාසහිත සමාගම් 2. සීමාරහිත සමාගම් 3. ඇපයෙන් සීමිත සමාගම්
(වර්ග තුනම නිවැරදිනම් ලකුණු 1යි)

<u>නිත්‍ය සන්තතික හැකියාව :</u> කොටස්කරුවකුගේ මරණය හෝ ඉවත්වීමක් සිදුවුවද සමාගමේ පැවැත්මට එය බාධාවක් නොවීම. එනම් අඛණ්ඩ පැවැත්මයි. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 1යි)

(iii) (ආ) 1. ස්වයංසේවා වෙළඳ සැල් ඇරඹීම හා වෙළෙඳසැල් නවීකරණය කිරීම. උදා : කෝප් සිටි, මිනි කෝප් සිටි, කෝප් සුපර්. 2. නව ව්‍යාපාර ක්ෂේත්‍රවලට පිවිසීම : උදා : සමුපාකාර රක්ෂණය, ඉන්ධන පිරවුම්හල්, අවමංගල්‍ය සේවා. 3. ජංගම වෙළඳ පොළවල් ඇරඹීම : උදා : විවිධ ආයතනවලට ගොස් ණය සහන පදනම මත භාණ්ඩ අලෙවිය. 4. විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය. (කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරක් නම්කර පැහැදිලි කිරීමට ලකුණු 2යි)

(ආ) <u>වරලත් ව්‍යාපාර :</u> කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක් එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළඳ ප්‍රදේශයක අලෙවිකිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව ලබාදෙයි නම් එම ව්‍යාපාර සංවිධාන ක්‍රමය වරලත් ව්‍යාපාර වේ. (නිවැරදි පැහැදිලි කිරීම් සහිත පිළිතුරට ලකුණු 1යි)

<u>වරලත් ව්‍යාපාර වර්ග :</u> 1. නිෂ්පාදිත වරලත් ව්‍යාපාර. 2. නිෂ්පාදන වරලත් ව්‍යාපාර. 3. ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර. (වර්ග තුනම නිවැරදිව නම්කිරීමට ලකුණු 1යි)

(iv) (අ) 1. ඒකාබද්ධවීම්. 2. අත්පත්කරගැනීම් (කරුණකට 1/2 බැගින් කරුණු 2ට ලකුණු 1යි)

<u>ඒකාබද්ධවීම් :</u> වෙන්වෙන්ම පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීම හෝ එක් සමාගමක් අනෙක් සමාගමේ වත්කම් හා වගකීම් මිලට ගැනීමෙන් තම සමාගමෙක් ඇතිකර ගැනීම. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 1/2 යි)

<u>අත්පත්කරගැනීම :</u> එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීම තුළ අයිතිය අත්පත් කරගැනීම. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 1/2 යි)

(ආ) 1. පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපයීම වැනි වෙළඳපොළ තත්ව පාලනය කිරීමට. 2. ඒකාධිකාරී ආයතන බිහිවීම වැළැක්වීමට. 3. ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වාගෙන යාමට. 4. පොදු ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට. 5. සම්පත් නාස්තිය අවම කර ගැනීමට. 6. ලාභ නොමැති පෞද්ගලික අංශය අත නොගසන වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාමට. (කරුණකට 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(v) ව්‍යවසායකයාට ලැබෙන ප්‍රතිලාභ :
1. තමාගේ කුසලතා හා හැකියා ප්‍රයෝජනයට ගතහැකි වීම. 2. සමාජ පිළිගැනීමක් හිමිවීම ආදිය.
ආයතනයට ලැබෙන ප්‍රතිලාභ :
1. තරඟකාරිත්වයට පහසුවෙන් මුහුණදිය හැකිවීම. 2. කර්මාන්තය පිළිබඳ දැනුම පුළුල් කරගතහැකිවීම
සමාජමය ප්‍රතිලාභ :
1. නව ව්‍යාපාරික අවස්ථා හිමි වීම. 2. ආදායම් අවස්ථා ජනිත වීම.

07. (i) (අ) නව්‍යතා සම්පාදනය, සංකල්ප ගොඩනැගීම, අවශ්‍ය සම්පත් සම්පාදනය, යථාර්ථයක් බවට පත්කිරීම, ප්‍රතිලාභ ලැබීම. (ලකුණු 02)

(ආ)

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| නව ව්‍යාපාරික අවස්ථා උදාකරයි. | පවත්නා ව්‍යාපාරික අදහස් ආශ්‍රයෙන් ව්‍යාපාර සිදුකරයි. |
| නවෝත්පාදකයෙකි. | සාම්ප්‍රදායිකව සිතන්නෙකි. |
| අවදානම්වලට මුහුණදෙයි. | ආරක්ෂිත ක්‍රියාමාර්ග වලට එළඹේ. |
| දුෂ්කරතාවලට ධෛර්යයෙන් මුහුණදේ | ප්‍රශ්නවලදී අධෛර්යයට පත්වේ. (ලකුණු 02) |

(ii) ආත්ම විශ්වාසය, කැපවීම, නිර්මාණශීලීවීම, අවදානම් බාරගැනීම.
(පැහැදිලි කිරීම් සහිත කරුණු 04 කට ලකුණු 4)

(iii) (අ) නායකත්ව කුසලතා, අන්තර් පුද්ගල කුසලතා, සන්නිවේදන කුසලතා, මූලික කළමණාකරණ කුසලතා
(ලකුණු 2)

(ආ) ස්වයං ඇගයීම, පුහුණුව, අධ්‍යාපනය, අත්දැකීම් තුළින් ප්‍රතිලාභ (ලකුණු 02)

(iv) (අ) නිවැරදි නිර්වචනයකට ලකුණු 2 ක් දෙන්න.

(ආ) ප්‍රමාණාත්මක : සේවක සංඛ්‍යාව, යොදා ඇති ප්‍රාග්ධනය, යොදාගෙන ඇති බලශක්ති ප්‍රමාණය
ගුණාත්මක : ව්‍යාපාර සංවිධාන වර්ගය, භාවිතාවන තාක්ෂණය, වෙළඳපොළ ස්වභාවය (ලකුණු 02)

(v) (අ) තමාගේ දක්ෂතා හා කුසලතා, වෙළඳපොළ ස්වභාවය, ව්‍යාපාර සංවිධාන වර්ගය, තරඟකාරිත්වය. (ල. 02)

(ආ) මූල්‍යමය ගැටළු, දුර්වල කළමණාකාරිත්වය, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම. තාක්ෂණික දැනුම දුර්වල වීම. (ලකුණු 02)

08. (i) 1. උපදේශන සේවා. 2. පර්යේෂණ හා තාක්ෂණික සේවා. 3. මූල්‍ය පහසුකම් 4. යටිතල පහසුකම්.
(අදාල ආයතන සහිත නම් ලකුණු 4)

(ii) (අ) 1. විනිමය මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීම. 2. වටිනාකම මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස ක්‍රියා කිරීම..

3. වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම. 4. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම.
(ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2)

(ආ) 1. ව්‍යවහාර මුදල් :
භාවිතයේ පවතින කාසි හා නෝට්ටු ව්‍යවහාර මුදල් ලෙස හඳුන්වයි. මේවා නිකුත් කරනුයේ රටක බලයලත් අධිකාරියක් විසිනි. ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සිදුකරනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවයි. ව්‍යවහාර මුදල්වල කිසිදු නෛසර්ගික වටිනාකමක් නැත. ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා පිළිගනුයේ නෛතික පිළිගැනීම නිසාය.

2. ආසන්න මුදල් :
මුදල් තරමම පූර්ණ ද්‍රවශීලතාවක් නොමැති එහෙත් ආසන්න ද්‍රවශීලතාවයක් පවතින තැන්පත් වර්ග හා මූල්‍ය පත්‍රිකා (උපකරණ) ආසන්න මුදල් ලෙස හැඳින්වේ. උදාහරණ : ඉතිරිකිරීම් තැන්පතු, ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්

3. බැංකු මුදල් :
බැංකු මුදල් යනුවෙන් හඳුන්වන්නේ වාණිජ බැංකුවල පවතින ජංගම ගිණුම්වල ශේෂයන්ය. ඉල්ලුම් තැන්පතු ලෙස හඳුන්වනයේද ජංගම ගිණුමය.

4. විද්‍යුත් මුදල් :
ගනුදෙනු සඳහා භාවිතා කෙරෙන ප්ලාස්ටික් කාඩ් විශේෂයක් ලෙස විද්‍යුත් මුදල් හැඳින්විය හැකිය. මේවා නිකුත් කරනුයේ ඒ සඳහා බලය ලැබූ වාණිජ බැංකුවක් හෝ වෙනත් මූල්‍ය ආයතනයක් විසිනි. විද්‍යුත් මුදල්වලට උදාහරණ ලෙස ණයපත්, හරපත්, පෙරගෙවුම්පත්
(වර්ග 4ක් දක්වා පැහැදිලි කිරීමට ලකුණු 2යි) නම්කිරීම් 2කට 1/2 බැගින් 4ට ලකුණු 1යි)

(iii) (අ) කල්බදු යනුවෙන් අදහස් කරනුයේ යම් ගිවිසුමක් යටතේ කිසියම් දේපොළක්, නිශ්චිත කාලයක් හෝ කාර්ය අවසාන වනතෙක් යම් පුද්ගලයෙකුට හෝ යම් ආයතනයකට බදු දීමය.
(නිවැරදි පැහැදිලි කිරීමකට ලකුණු 1/2)

| **මූල කල්බදු** | **මෙහෙයුම් කල්බදු** |
|---|---|
| 1. ගිවිසුම සාපේක්ෂ වශයෙන් දිගුකාලීනයි. | 1. ගිවිසුම සාපෙක්ෂව කෙටිනාලීනවේ. |
| 2. ගිවිසුමේ කොන්දේසි සාපේක්ෂ වශයෙන් දැඩිවීම | 2. කල්බදු ගිවිසුමේ කොන්දේසි සරල වීම |
| 3. බදු කාලය අවසානයේ අයිතිය ගැනුම්කරුට පැවරේ. | 3. බදුකාලය අවසානයේ අයිතිය කල්බදු සමාගමට පැවරේ. |
| 4. නඩත්තුව බදු ගැනුම්කරු කළ යුතුය. | 4. නඩත්තුව කල්බදු සමාගම විසින් කළයුතුය. |
| 5. කල්බදු වාරික වශයෙන් ගෙවිය යුතුය. | 5. කල්බද්ද එකවර ගෙවිය යුතුය. |

(වෙනස්කම් 1කට ලකුණු 1/2 බැගින් වෙනස්කම් 3කට ලකුණු 1 1/2)

(ආ) ආයෝජන කළඹ :
ඒකක භාරයක් විසින් ඒකක විකිණීමෙන් රැස්කරගත් මුදල් ආයෝජන කළඹක යොදවන අතර ආයෝජන කළඹක් යනු ඒකක විකිණීමෙන් ලබන මුදල් විවිධ ආයෝජන මාර්ගවල යොදන අතර එම ආයෝජන මාර්ගවල එකතුවට ආයෝජන කළඹක් ලෙස හඳුන්වයි. (මෙම අදහස් ඇත්නම් ලකුණු 1/2 යි)

ආයෝජන මාර්ග :
1. සාමාන්‍ය කොටස් 2. ණයකර 3. වාණිජ පත්‍රිකා 4. භාණ්ඩාගාර බිල්පත් 5. ස්ථාවර තැන්පතු
(කරුණු 3ට ලකුණු 1 1/2)

(iv) (අ) 1. ආර්ථික හා මිල ස්ථායිතාවය 2. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය.
(නිවැරදි කරුණු එකකට ලකුණු 1/2 බැගින් දෙකට ලකුණු 1යි)

(ආ) 1. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම. 2. බැංකුවල බැංකුව ලෙස ක්‍රියාකිරීම. 3. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම. 4. රජයේ බැංකුව ලෙස ක්‍රියාකිරීම. 5. රජයේ ආර්ථික හා මූල්‍ය උපදේශකයා ලෙස ක්‍රියා කිරීම. 6. රාජ්‍ය ණය හා විනිමය පාලන කටයුතුවලදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියාකිරීම. 7. බැංකු සංවර්ධන කටයුතුවලට මැදිහත්වීම. (නිවැරදි කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 6කට ලකුණු 3)

(v)(අ) 1. ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු) 2. ඉතිරි කිරීමේ තැන්පතු 3. ස්ථාවර තැන්පතු
(එකකට ලකුණු 1/2 බැගින් 3ට ලකුණු 1 1/2 යි)

(ආ)

| **බැංකු ණය** | **බැංකු අයිරා** |
|---|---|
| 1. බැංකු ණය මුදලක් ලබා ගැනීමට ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ. | 1. බැංකු අයිරාවක් ලබාගැනීමට ජංගම ගිණුමක් අවශ්‍ය වේ. |
| 2. දිගුකාලීනයි. | 2. කෙටිකාලීනයි. |
| 3. ඇප සුරකුම් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. | 3. ඇප සුරකුම් ඉදිරිපත්කිරීම අත්‍යවශ්‍ය නොවේ |
| 4. සාපේක්ෂ වශයෙන් පොලිය අඩුය | 4. සාපේක්ෂ වශයෙන් පොලිය වැඩිය. |
| 5. ගිවිසගත් පරිදි වාරික සහ පොලිය ගෙවිය යුතුය. | 5. වාරික වශයෙන් ගෙවීම් ක්‍රම නැත. |

6. ණය ගනු ලබන්නේ කුමක් සඳහාද යන්න සඳහන් කළයුතු අතර එම ණය මුදල ඒ සඳහාම භාවිතා කළ යුතුය. 6. එසේ සඳහන් කළ යුතු නැත.(ඕනෑම නිවැරදි වෙනස්කම් 1කට ලකුණු 1/2 බැගින් වෙනස්කම් 5කට ලකුණු 2 ½යි)